චක්‍රලේඛ අංක : 05/2014

මගෙ අංකය : බප/සසෙකො/0-චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2014. 09. 30

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල, ස.ණ.ස. සමිති සහ
ස.ණ.ස. සංගම්වල සභාපතිවරුන් වෙත.

## විනය පරීක්ෂණවලදී ගෙවීම්

සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 5:10:1 සිට 5:10:5 දක්වා වන වගන්ති සංශෝධනය කරමින් නිකුත් කරන ලද 15/2005, 15/2005(1), 15/2005 (11) සහ 05/2008 අංක දරන චක්‍රලේඛ මෙයින් අවලංගු කරන අතර, කාර්ය විධිවිධාන සංග්‍රහයේ එකී වගන්ති වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කිරීම, බස්නාහිර පළාත් සමුපකාර කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

5:10:1 විනයානුකූල පරීක්ෂණ පැවැත්වීම වෙනුවෙන් කරනු ලබන ගෙවීම් 2014.06.30 දින සිට පහත සඳහන් පරිදි විය යුතුය.

| | පරීක්ෂණය පැවැත්වෙන පැයකට දීමනාව | ලිපිකරු / යතුරුලේඛක සහාය තැපැල් ගාස්තු වශයෙන් වැයවූ මුදල් ප්‍රතිපූරණය කිරීම | අවසාන වාර්තාව පිළියෙල කිරීම |
|---|---|---|---|
| විනය පරීක්ෂණ නිලධාරී | | | |
| I. විශ්‍රාමික | රු. 300/- | රු. 1,500/- | රු. 3,000/- |
| II. රාජ්‍ය සේවයේ / සංස්ථා සේවයේ නියුතුවූවන්, | රු. 300/- | රු. 1,500/- | රු. 3,000/- |
| III. අදාල සමිතියේ සේවයේ නියුතුවූවන් | රු. 300/- | - | රු.3,000/- |
| පැමිණිල්ල මෙහෙයවන නිලධාරී | රු. 200/- | - | රු. 1,000/- |

5:10:1:1 සමුපකාර සමිතිය විසින් ලිපිකරු / යතුරු ලේඛක සහාය හා තැපැල් ගාස්තු සපයනු ලබන්නේ නම් ඒ සඳහා වෙන් කර ඇති මුදල ලැබීමට හිමිකමක් නැත

5:10:2 විනය පරීක්ෂණයට අදාලව කාර්ය සටහන් යතුරුලියනය කිරීමේ දී හෝ පරිගණකගත කිරීමේ දී හෝ යතුරුලියන්නෙකුට පැයක කාලයක් සඳහා රු.125/- ක දීමනාවක් ගෙවිය යුතු වේ.

5:10:3 විනය පරීක්ෂණ / තීරණ විභාග / අභියාචනා පරීක්ෂණ යන කවර අවස්ථාවකදී වුවද පැමිණිල්ල මෙහෙයවන නිලධාරියාට ගෙවිය යුත්තේ ඉහත 5:10:1 හි සඳහන් පරිදිය.

5:10:4 ඉහත සඳහන් දීමනාවට අමතරව අභියාචනා පරීක්ෂණ නිලධාරියා / විනය පරීක්ෂණ නිලධාරියා / මෙහෙයවන නිලධාරියා රජයේ හෝ සංස්ථා සේවයේ විශ්‍රාමිකයෙකු නම් ඔහු විශ්‍රාම යන විට දැරූ තනතුර පදනම් කර ගෙන ද, රජයේ හෝ සංස්ථා සේවයේ දැනට සේවයේ යෙදී සිටින නිලධාරියෙකු නම් ඔහු දරණ තනතුර පදනම් කරගෙන ද, රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත. අභියාචනා පරීක්ෂණ නිලධාරියා / පැමිණිල්ල මෙහෙයවන නිලධාරියා / විනය පරීක්ෂණ නිලධාරියා සමුපකාර සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු

නම් ඔහු විශ්‍රාම යන විට දැරූ තනතුර පදනම් කරගෙන ද, දැනට සමුපකාර සේවයේ නියුතු නිල නිලධාරියෙකු නම් ඔහු දරණ තනතුර පදනම් කරගෙන ද සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.

5:10:5 විනය පරීක්ෂණ නිලධාරියෙකු / පැමිණිල්ල මෙහෙයවන නිලධාරියෙකු, පරීක්ෂණය සඳහා නියම කළ ස්ථානයට, නියමිත දින, නියමිත වේලාවට පැමිණියමුත්, ඔහු වගකිව යුතු වන්නේ නැති විශේෂ කරුණක් පදනම් කරගෙන මෙම පරීක්ෂණ වෙනත් දිනකට කල් තබන්නේ නම් සම්පූර්ණ සැසියක් සඳහා ගෙවිය යුතු මුදලින් එක් අඩක් ඔහුට ගෙවිය යුතුය. සම්පූර්ණ සැසියක් යනුවෙන් හඳුන්වන්නේ පැය 08 ක කාල සීමාවකි. එහෙත් පරීක්ෂණය පැය 04 කට අඩු කාලයක් පවත්වා වෙනත් දිනකට කල් තබන්නේ නම් මෙම සහනය හිමි වන්නේ නැත.

5:10:6 මාස 06 ක කාලයක් තුළ විනය පරීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව විනය බලධාරියාට භාර දෙන්නේ නම් පමණක්, ඉහත 01 ඡේදයේ සඳහන් සියළු දීමනාවලට අමතරව රු. 3,000/- ක දීමනාවක් විනය පරීක්ෂණ නිලධාරියාට ගෙවිය හැකිය.

5:10:7 අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාද වන අවස්ථාවල දී මෙම චක්‍රලේඛයේ 5:10:1 හා 5:10:6 හි සඳහන් පරිදි විනය පරීක්ෂණ නිලධාරියාට ගෙවනු ලබන සියළුම දීමනාවලින් පහත සඳහන් ආකාරයට අඩු කර ගෙවිය යුතුය.

i. මාස 12 කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 5% ක්,
ii. මාස 18 කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 10% ක්,
iii. මාස 24 ක් හෝ ඊට වැඩි කාලයක් ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 25% ක්,

5:10:8 යම්කිසි විශේෂිත හේතුවක් පදනම් කර ගෙන පරීක්ෂණයේ වාර්තාව ලබා දීමට මාස 06 කට වඩා ප්‍රමාද වන්නේ නම් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලිඛිත අනුමැතිය ඒ සඳහා ලබා ගෙන තිබේ නම් දීමනාවෙන් 50% ඉක්මවා ගෙවීම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය තිබේ.

ඩබ්.පී.එම්.ජී.ආර්.ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් : 1. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
2. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්,සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර,ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය
3. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
4. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, බස්නාහිර පළාත.
5. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව
6. සියළුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
7. සියළුම වෘත්තීය සමිති සංගම්